**නීති ආධාර කොමිෂන් සභාව - 2018**

-----------------------------------------------------

## 1.1 විගණනයකළ මතය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.5.1 <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම</u>

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උපචිත පදනම මත ආදායම් හා වියදම් ගිණුම්ගත කිරීම කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිය බව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර තිබුණද, රු.405,188 ක ස්ථාවර තැන්පත් පොළී ආදායම මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | 2019 වර්ෂයේ සිට ස්ථාවර තැන්පත් පොළී උපචිත පදනම මත ගිණුම් ගත කිරීම කරනු ඇත. | හෙළිදරව් කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මත කටයුතු කළ යුතුවේ. |

### 1.5.2 <u>අධිකාරී බලය නොලත් ගනුදෙනු</u>

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 හි විධි විධානයන්ගෙන් බැහැරව කොමිෂන් සභාවේ සේවකයන් වෙනුවෙන් 2015 වර්ෂයේදී පෞද්ගලික රක්ෂණ ක්‍රමයක් ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා සේවකයන් 46 දෙනෙකු වෙනුවෙන් රක්ෂණ දායකයෙන් සියයට 50 ක් වූ රු.1,335,941 ක් පෞද්ගලික රක්ෂණ සමාගමක් වෙත කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි. | ඔබගේ නිර්දේශ පිළිගනිමි. | මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 හි විධි විධානපරිදි කටයුතු කළ යුතු වේ. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ)හිමිකම හා ප්‍රාග්ධනය | 33,747,436 | ලෙජර් ගිණුම්/ උපලේඛන | Equity 12,827,777 Capitalb/f 51,300,000<br>During the year 18,092,806<br>Retained Earning (36,998,200)<br>Defect during year (13,838,669)<br>31,383,715 | මූල්‍ය ප්‍රකාශනවලට පදනම් වන තොරතුරු සනාථ කර ගැනීමට අවශ්‍ය විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. |
| (ආ)රඳවාගත් ඉපයීම් | (36,998,200) | ලෙජර් ගිණුම්/ උපලේඛන | ආයතනයේ භාවිතා කරන Quick Book Package හි අන්තර්ගත රඳවාගත් ඉපයීම් වල ලෙජර් මුද්‍රිත පිටපත් ලබාගත නොහැක. | මූල්‍ය ප්‍රකාශනවලට පදනම් වන තොරතුරු සනාථ කර ගැනීමට අවශ්‍ය විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. |
| (ඇ) පෙර වර්ෂයේ ගැළපීම් | රු.4,995,019 ක | ආරම්භක ශේෂය ලෙස පැවති රු.4,995,019 ක වටිනාකම වසර තුළ පියවූ ආකාරය දැක්වෙන ලෙජර් ගිණුම් | ඔබගේ නිර්දේශ පිළිගනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවලට පදනම් වන තොරතුරු සනාථ කර ගැනීමට අවශ්‍ය විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. |

**1.5.4 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමක 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක සාමාන්‍ය ඉතිරිය රු. 25,728,148 ක් විය. මෙම කාලපරිච්ඡේදය පුරාම රු. මිලියන 21 ත් රු. මිලියන 33 ත් අතර මුදලක් උපයෝජනයකින් තොරව පැවති අතර මෙම මුදල් ඵලදායි ලෙස ආයෝජනය කිරීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | කලින් දන්වා ඇති පරිදි එම අරමුදල ආරම්භයේ සිට පැවති මුදලකි. වර්ෂයට අදාළව ලැබෙන මුදල් ප්‍රමාණය අවම වූ අවස්ථා වලදී එම අරමුදල් භාවිතා කරමි. උදා: මෙම වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් ප්‍රමාණය සම්පූර්ණයෙන් වියදම් වූ නිසා ඉහත අරමුදලෙන් ලබාගෙන පියවා ගන්නා ලදී. | අතිරික්ත මුදල් ආයෝජනය කර මූල්‍ය සම්පත් නිෂ්කාර්යව පවත්වා නොගෙන ආදායම් ඉපයීම කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 13,838,669 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 22,153,149 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,314,480 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ගොඩනැගිලි හා නඩත්තු වියදම් රු. 1,797,441 කින් අඩුවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව ප්‍රකාරව නීති ආධාර සැපයීම සඳහා 2017 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාව ඇතුළුව සමාලෝචිත වර්ෂයේ කටයුතු කිරීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 42,506 ක් විය. එයින් නඩු 10,075 ක් පමණ නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී නීතිඥ සහය (නීති ආධාර) ලබා දී තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විටත් තවදුරටත් සේවා සැපයීම සඳහා ඉතිරි නඩු ප්‍රමාණය 32,431 ක් විය. එය මුළු සේවා සැපයිමට අදාළ නඩු සංඛ්‍යාවෙන් සියයට 76 ක ප්‍රතිශතයක් විය. | නඩු කටයුතුවල පවතින ප්‍රමාදය සමස්ථ අධිකරණ පද්ධතියේම පවතින සාමූහික ප්‍රශ්නයකි. | නීතිඥ සහය (නීති ආධාර) ලබා දීමේ කාර්යය කොමිෂන් සභාවේ මූලික කාර්යභාරය බැවින් එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුවේ. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 වර්ෂයේ කොමිෂන් සභාව විසින් රුවන්වැල්ල, ඇල්පිටිය, ගලගෙදර, ආණමඩුව හා හෙට්ටිපොළ යන ස්ථානවල මධ්‍යස්ථාන 05 ක් ඉදිකිරීම සඳහා රු.15,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ආනමඩුව මෙම වර්ෂයේ කිරීමට බලාපොරොත්තු වන අතර , ඇල්පිටිය වෙනුවට බිබිලේ මධ්‍යස්ථානය මෙම වර්ෂයේ ඉදිකිරීමට බලාපොරොත්තු වේ. රුවන්වැල්ල මධ්‍යස්ථානය වෙනුවට වත්තල මධ්‍යස්ථානය ආරම්භ කර ඇත. | ව්‍යාපෘති වලට අදාළ වියදම නිවැරදිව ඇස්තමේන්තු කර එම ව්‍යාපෘති ඉටු කිරීමට ඇති ශක්‍යතාව මත ප්‍රතිපාදන ලබාගත යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේ නව ශාඛා කාර්යාල 02 ක් කළුතර හා කඩුවෙල යන ප්‍රදේශවල ඉදිකිරීම සඳහා රු.2,840,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීම් කටයුත්තක් සිදු නොකිරීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | කළුතර මධ්‍යස්ථානය වෙනත් ස්ථානයක ඉදි කළයුතු බව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දන්වා ඇත. ඒ සඳහා වෙනත් භූමියක් ලබාදී ඇති බව අප විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත දන්වා ඇති මුත් අමාත්‍යාංශය විසින් එම භූමිය පවරා ගෙන අප වෙත මේ වන තෙක් දැනුම්දී නොමැති නිසා ඒ සඳහා ක්‍රියා කිරීමට නොහැකි වී ඇත.<br><br>කඩුවෙල හා දඹුල්ල මධ්‍යස්ථානවල ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලැස්ම නගර සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීමෙන් අනතුරුව ඔවුන් විසින් දැනට පවතින උසාවි භූමියේ ඔප්පුව හා ප්ලෑන ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඒ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශය දැනුවත් කර ඇතත් ඔවුන් මේ වන තෙක් එය ඉදිරිපත් කර නොමැති නිසා මේ වන තෙක් ඉදිකිරීම් කටයුතු කිරීමට නොහැකි වී ඇත. | ව්‍යාපෘති වලට අදාළ වියදම නිවැරදිව ඇස්තමේන්තු කර එම ව්‍යාපෘති ඉටු කිරීමට ඇති ශක්‍යතාව මත ප්‍රතිපාදන ලබාගත යුතුවේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක් සඳහා 2018 දෙසැම්බර් 31 දිනට අනුමත සංඛ්‍යාව 16 ක් වුවද, මුළු තනතුරු සංඛ්‍යාවම පුරප්පාඩුව පැවතුණු අතර, එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. එසේම කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 02 දෙනෙකු කොන්ත්‍රාත් පදනමට සහ නිලධාරීන් 51 දෙනෙකු ස්ථිර පදනමට බඳවා ගෙන සේවයේ යොදවා තිබුණි . | 2018 වර්ෂයේදී බඳවා ගැනීමේ පටිපාටි කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. එහෙයින් මෙම පුරප්පාඩු සපුරාගැනීමට නොහැකි විය. බඳවා ගැනිමේ ක්‍රියාපටිපාටිය අනුමත වූයේ 2019 වර්ෂයේ ජනවාරි සිටය. එහෙයින් ඉදිරියේදී පුරප්පාඩු සපුරා ගැනීමට ක්‍රියා කරනු ඇත.<br>අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරු 6 ක් නොව 5 ක් පමණි. ඔවුන් බඳවාගන්නා විට , තිබූ තනතුරු අනුව බඳවාගෙන ඇත. ඉදිරියේදී අනුමත කාර්ය මණ්ඩලය අනුව ඔවුනුව එම තනතුරු අනුව පිහිටවනු ලැබේ. | අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සම්පූර්ණ කර ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි යෝජනා වී ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථාන ජාලගත කරමින් නීති අංශයේ පරිපාලන කටයුතු සඳහා වූ ඊ වාර්තාව සැකසීමට රු.500,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. | ඊ වාර්තාව සඳහා වියදම් නොකළත් එහි සැලසුම් කරන පාර්ශවයන් සමඟ එක්වී එම සැලැස්ම පිළිබඳව සාකච්ඡා කරමින් පවතී. | ක්‍රියාකාරී සැලැස්මෙහි වූ ඉලක්ක නිසි පරිදි සපුරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |